# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1783/34 - 2012 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2012.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත

3 වැනි වගන්තිය යටතේ නියෝග

2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම ගැසට් නියෝගය මගින්,

(අ) පහත I උපලේඛනයේ, I හා II වැනි තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ඊට අනුරූපව III වැනි තීරුවෙහි සඳහන් වූ විස්තරය යටතේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ආනයනය කිරීමේ දී ඊට අනුරූපව IV වන තීරුවෙහි සඳහන් පරිදි 2.5%ක වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සහනදායී අනුපාතය ගෙවිය යුතු බව, සහ

(ආ) පහත II වන උපලේඛනයේ, I හා II වැනි තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ඊට අනුරූපව III වැනි තීරුවෙහි සඳහන් වූ විස්තරය යටතේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ආනයනය කිරීමේ දී ඊට අනුරූපව IV වන තීරුවෙහි සඳහන් පරිදි වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ගෙවීමෙන් නිදහස් වන බව, සහ

(ඇ) නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලබන සෞඛ්‍ය ආයතනයක් සඳහා පරිත්‍යාග කිරීමට ආනයනය කරනු ලබන, අදාළ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශයට යටත්ව මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෛද්‍ය උපකරණ, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ගෙවීමෙන් නිදහස් වන බව, ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය I*

| *I* | *II* | *III* | *IV* |
|---|---|---|---|
| *සං.ව. ශීර්ෂය* | *සංයෝගීකරණ වර්ගීකරණ සංකේතය* | *විස්තරය* | *සහන අනුපාතය* |
| 34.02 | | **(සබන් හැර) කාබනික පෘෂ්ඨ ක්‍රියාකාරක ශීර්ෂ 34.01 යටතේ ගැනෙන ඒවා හැර සබන් අඩංගු වූ හෝ නොවූ, පෘෂ්ඨ ක්‍රියා කාරක සකස් කිරීම්, සේදීම සඳහා සකස්කළ, (සේදීමට සකස් කළ සහායක දේ ඇතුළුව) සහ පවිත්‍ර කිරීමට සකස් කළ.** | |
| | | | |
| | | සිල්ලරට වෙළඳාම සඳහා ඉදිරිපත් කළ හෝ නොකළ කාබනික පෘෂ්ඨ ක්‍රියාකාරක : | |
| | 3402.11 | ඇනායනික | 2.5% |
| | 3402.12 | කැටායනික | 2.5% |
| | 3402.13 | අයනික නොවන | 2.5% |
| | 3402.19 | අනෙකුත් | 2.5% |
| 84.48 | | **84.44, 84.45, 84.46 හෝ 84.47 ශීර්ෂයේ යන්ත්‍ර සමග භාවිතය සඳහා සහායක යන්ත්‍ර සූත්‍ර (උදාහරණ වශයෙන්, ඩොබී, ජැකාඩ්, ස්වයංක්‍රීය නැවතුම් උපක්‍රම හා ෂටල වෙනස් කිරීමේ යන්ත්‍රන) ; මෙම ශීර්ෂය හෝ 84.44, 84.45, 84.46 හෝ 84.47 ශීර්ෂයේ යන්ත්‍ර සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් භාවිතය සඳහා කොටස් සහ උපාංග (උදාහරණ වශයෙන් ඉද්ද සහ ඉද්ද පියාඹනයන්, කාඩ ක්ලෝතින්, පනා, නෙරවන පුඩු, ෂටල, පුඩුවැල් සහ පුඩුවැල් රාමු සහ එසවුම් ඉදිකටු).** | |
| | | 84.47 ශීර්ෂයේ යන්ත්‍රවල හෝ ඒවායේ සහායක යන්ත්‍ර සූත්‍රවල කොටස් සහ උපාංග : | |
| | 8448.51 | මැහුම් දැමීමේ දී භාවිතය සඳහා ගිල්ලුම්, ඉදිකටු සහ අනෙකුත් භාණ්ඩ | 2.5% |
| 84.51 | | **(84.50 ශීර්ෂයේ යන්ත්‍ර හැර) පේෂකර්ම නූල්, රෙදිපිළි හෝ නිම කළ පේෂකර්ම භාණ්ඩ සේදීම, පිරිසිදු කිරීම, මිරිකීම, වියළීම, මැදීම, තද කිරීම (විලීන වීමට තද කිරීම ඇතුළුව), සුදු කිරීම, සායම් දැමීම, සැරසීම, නිමැවීම, ආවරණය කිරීම හෝ ගැබ් කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර සහ ලිනොලියම් වැනි බිම් ආවරණ නිෂ්පාදනය සඳහා භාවිතා කරන රෙදි පසුතලයකට හෝ වෙනයම් ධාරකයකට පාප්ප යෙදීම සඳහා යන්ත්‍ර ; පේෂකර්ම රෙදිපිළි එතීම, දිග හැරීම, නැවීම, කැපීම හෝ කුඩා හිල් විදීම සඳහා යන්ත්‍ර.** | |
| | 8451.90 | කොටස් | 2.5% |
| 84.52 | | **84.40 ශීර්ෂයේ පොත් මහන යන්ත්‍ර හැර, මහන යන්ත්‍ර ; මහන යන්ත්‍ර සඳහා විශේෂයෙන් සැලසුම් කළ ගෘහ භාණ්ඩ, පදනම්, සහ වැසුම් ; මහන යන්ත්‍ර ඉදිකටු** | |
| | 8452.30 | මහන යන්ත්‍ර ඉදිකටු | 2.5% |
| | 8452.90 | මහන යන්ත්‍ර සඳහා ගෘහ භාණ්ඩ, පදනම් හා වැසුම් සහ ඒවායේ කොටස්, මහන යන්ත්‍ර වල අනෙකුත් කොටස් | |
| | 8452.90.10 | මහන යන්ත්‍ර සඳහා ගෘහ භාණ්ඩ, පදනම් සහ වැසුම් සහ ඒවායේ කොටස් | 2.5% |
| | 8452.90.90 | මහන යන්ත්‍රවල අනෙකුත් කොටස් | 2.5% |

උපලේඛනය II

| I | II | III | IV |
|---|---|---|---|
| සං.ව. ශීර්ෂය | සංයෝගීකරණ වර්ගීකරණ සංකේතය | විස්තරය | සහන අනුපාතය |
| 27.01 | | **ගල්අඟුරු, ගල්අඟුරු වලින් නිපදවන ලද ගඩොලිති, අණ්ඩාකාර කැට සහ ඒ හා සමාන ඝන ඉන්ධන වර්ග.** | |
| | | | |
| | | ගල් අඟුරු, සුනුකළ හෝ නොකළ එහෙත් සම්පිණ්ඩනය නොකළ : | |
| | 2701.11 | ඇන්ත්‍රාසයිට් | නිදහස් |
| | 2701.12 | ගල්කීලමය ගල් අඟුරු | නිදහස් |
| | 2701.19 | අනෙකුත් ගල් අඟුරු | නිදහස් |
| 76.10 | | **ඇලුමිනියම් වලින් තැනූ ශීර්ෂ 94.06 යටතේ ගැනෙන (ගලපා සැකසූ ගොඩනැගිලි හැර) නිර්මාණ සහ නිර්මාණ කොටස් (උදාහරණ වශයෙන්, පාලම් සහ ඛණ්ඩ, ටවර්, ලැටිඩ මාස්ට්, පියසි, පියසි රාමු, දොර සහ ජනෙල් සහ ඒවායේ රාමු සහ දොරවල් සඳහා උළුවහු, ගරාදි, කුලුණු සහ කණු) නිර්මාණ සඳහා පාවිච්චි කරනු ලබන ඇලුමිනියම් තැටි, දඬු, නොනිමි හැඩයන්, නළ සහ එවැනි දෑ ; නිර්මාණ** | |
| | | | |
| | 7610.90 | **අනෙකුත්** | |
| | 7610.90.10 | ගොඩනැගිලි ඇතුළත ආලෝකකරණය සඳහා සූර්යාලෝකය අවශෝෂණය කර විස්තාරණය කරන උපකරණ | නිදහස් |
| | | | |
| 85.01 | | **විද්‍යුත් මෝටර් සහ ජනක යන්ත්‍ර (ජෙනරේටර්) (ජනක කට්ටල වලට බාහිරව)** | |
| | | | |
| | 8501.31 | ප්‍රතිදානය වොට් 750 නොඉක්ම වූ : | |
| | 8501.31.10 | විද්‍යුත් ශක්තිය ප්‍රතිදානය සඳහා අවශ්‍ය උපාංග සවි කරන ලද සහ පැනල හෝ ඒකක වශයෙන් සැකසුණු සූර්යය කෝෂ | නිදහස් |
| | | | |
| 85.13 | | **85.12 ශීර්ෂයේ ආලෝකකරණ උපකරණ හැර අතේ ගෙන යා හැකි, ඒවායේ ස්වයං බලශක්ති ප්‍රභවයන්ගෙන් ක්‍රියා කළ හැකි පරිදි සැළසුම් කළ විද්‍යුත් ලාම්පු (උදාහරණ වශයෙන් වියළි බැටරි, සංචායක, මැග්නෙටෝ)** | |
| | | | |
| | 8513.10 | ලාම්පු : | |
| | 8513.10.10 | එහා මෙහා ගෙන යා හැකි, සූර්‍ය්‍ය විදුලියෙන් ක්‍රියා කරන වෝල්ට් 12, සරල ධාරා ලාම්පු | නිදහස් |
| | | | |
| 85.39 | | මුද්‍රා තැබූ කදම්බ ලාම්පු ඒකක සහ පාර - ජම්බූල හෝ අධෝ - රක්ත ලාම්පු ඇතුළු විද්‍යුත් සූත්‍රිකා හෝ විසර්ජන ලාම්පු ; චාප - ලාම්පු | |
| | | පාර - ජම්බූල ලාම්පු හැර, විසර්ජන ලාම්පු : | |
| | | | |
| | 8539.31 | ෆ්ලොරසන්ට්, උණුසුම් කැතෝඩ : | |
| | 8539.31.20 | වෝල්ට් 12 සරල ධාරා ප්‍රතිදීප්ත ලාම්පු (ඍජු බට සහ සංයුක්ත ආකාරයේ) | නිදහස් |

| I | II | III | IV |
|---|---|---|---|
| *සං.ව. ශීර්ෂය* | *සංයෝගීකරණ වර්ගීකරණ සංකේතය* | *විස්තරය* | *සහන අනුපාතය* |
| 85.41 | | **ඩයෝඩ, ට්‍රාන්සිස්ටර් සහ සමාන අර්ධ සන්නායක උපක්‍රම ; පනේල වශයෙන් සාදන ලද හෝ මොඩියුල වශයෙන් ඒකරාශි කරන ලද හෝ එසේ නොකළ, පොටෝවෝල්ටේක් කෝෂ ඇතුළුව, ඡායා සංවේදී අර්ධ සන්නායක උපක්‍රම ; ආලෝක නිකුත් කරන ඩයෝඩ ; නංවන ලද පීසෝ ඉලෙක්ට්‍රික් ස්ඵටික** | |
| | | | |
| | 8541.40 | පනේල වශයෙන් සාදන ලද හෝ මොඩියුල වශයෙන් ඒකරාශී කරන ලද හෝ එසේ නොකළ, පොටෝවෝල්ටේක් කෝෂ ඇතුළුව, ඡායා සංවේදී අර්ධ සන්නායක උපක්‍රම, ආලෝක නිකුත් කරන ඩයෝඩ ඃ | නිදහස් |
| | | | |
| 90.32 | | **ස්වයංක්‍රීය නියාමනය හෝ පාලනය කිරීමේ මෙවලම් සහ උපකරණ කට්ටල** | |
| | | | |
| | 9032.89.10 | සූර්ය ශක්තියෙන් උත්පාදනය කරන සරල ධාරා මගින් විද්‍යුත් සංචායක ආරෝපනය කිරීම හැසිරවීම සඳහා සහ සරල ධාරා බෙදාහැරීම සඳහා උපකරණ ("චාර්ජ් කන්ට්‍රෝලර්ස්" සහ එවැනි දෑ) | නිදහස් |
| | | | |
| 94.05 | | **අන් ස්ථානයක නිශ්චිත නොවූ හෝ ඇතුළත් නොවූ, ගවේෂණලෝක සහ ස්ථානීය ඉලක්ක ආලෝක ඇතුළුව, ලාම්පු සහ ආලෝක කරණ සවිකිරීම් සහ ඒවායේ කොටස් ; අන් ස්ථානයක නිශ්චිත නොවූ හෝ ඇතුළත් නොවූ, නිත්‍ය ලෙස සවිකළ ආලෝක ප්‍රභවයක් සහිත, ප්‍රදීපනය කළ ලාංඡන, ප්‍රදීපනය කළ නාම පුවරු සහ එවැනි දේ සහ ඒවායේ කොටස්** | |
| | | | |
| | 9405.10.20 | වෝල්ට් 12 සරල ධාරා සූර්ය ලාම්පු | නිදහස් |
| | 9405.20.20 | වෝල්ට් 12 සරල ධාරා සූර්ය ලාම්පු | නිදහස් |
| | 9405.40.40 | වෝල්ට් 12 සරල ධාරා සූර්ය ලාම්පු | නිදහස් |
| | 9405.50.20 | **ගොඩනැගිලි ඇතුළත ආලෝකකරණය සඳහා සූර්යාලෝකය අවශෝෂණය කර විස්තාරණය කරන උපකරණ** | නිදහස් |

11-1006

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.